# බිඟු සම්පත සුරැකීමේ සංවිධානය

**BEE PROTECTION ORGANIZATION**

13 ඒ, ඔගස්ටාවත්ත, මහනුවර    wijayabeekandy@yahoo.com    077-6062683
077-2407217


2024/11/30

## බඹර බිය දුරු කරමු - තේ ලඳුන් රැක ගනිමු



ශ්‍රී ලාංකීය ආර්ථිකයේ දැවැන්තයින් තේ, පොල්, රබර් යයි අප කුඩා කල සිට අසා ඇත. සැබැවින්ම දශක ගණනාවක් පුරා තේ ආර්ථිකය අපට කළ මෙහෙවර මොන තරම් අගනේද ? මේ මහා ධන නිධානය පිටුපස සිටින වතු කම්කරු ජනතාව මේ ස්වර්ණමය ධන නිධානයේ පෙර ගමන්කරුවන්ම වන්නේය. ඔවුන්ගෙන් සිදුවන මෙහෙවර රුපියල් හෝ ඩොලර් වලින් තක්සේරු කිරීමට බැරි තරම් විශාල වන්නේය. දශක ගණනාවක් පුරා ඔවුහු ශ්‍රී ලාංකීය දේශයේ නිල නොලත් තානාපතිවරු ලෙස සේවය කොට ඇති අතර ලෝකය පුරා රස බලන තේවල දහදිය සහ රුධිරය හිමි මේ අහිංසක පුරවැසියෝ බොහෝ දුක් පීඩා විඳින සත්ව කොට්ඨාශයක් බවට පත්කර ඇත්තේය. ඔවුන්ගේ ප්‍රධාන ආහාර වේල පාන්පිටි රොටී, තේ කහට සහ නැවත නැවතත් කුසගින්නම වන්නේය. ඉතා අපිරිසිදු ලයින් කාමර, ශිෂ්ඨාචාරයෙන් තොර අඳුරු සහ අපිරිසිදු සිර ගෙවල්ම වන අතර එක් අඳුරු කාමරයක් තුළ මව්පියන් ද, දූ පුතුන් ද පෙනෙන නොපෙනෙන අඹු සැමියන් වන්නේය. සැබැවින්ම ශ්‍රී ලංකාවේ තේ ආර්ථිකය දෙවැනි වන්නේ ලොව පරසිඳු වහල් වෙළඳාමට පමණක්ම වන්නේය. මෙවැනි ඛේදනීය පරිසරයක් තුළ ඔවුන්ට බඹර ප්‍රහාරයන් එල්ල වන්නේ නම්, ප්‍රහාරයන්ගෙන් රෝගී වන්නේ නම්, රෝහල් ගත වන්නේ නම් මරණයට පත් වන්නේ නම් ඒ මොන තරම් අවාසනාවක් ද ? සැබැවින්ම එය එසේම සිදු වන්නේය. පසුගිය ඔක්තෝම්බර් මාසයේද එවන් මරණයක් සිදු වී ඇත. වසර පුරාම එසේම සිදු වන්නේය. එහෙත් කවදාවත් ශ්‍රී ලංකාවේ පහළ සහ ඉහළ

පාලක පැලැන්තීන් ඒ පිළිබඳව කවදාවත් අවධානය යොමු කර නැත්තේය. දේශයේ ප්‍රශ්න සාකච්ඡාවට භාජනය වන පාර්ලිමේන්තුවේද ඒ පිළිබඳව සලකා බලා නැත. තේ වතු අධිරාජ්‍ය පුරා අණසක පවත්වාගෙන ගිය සාම්ප්‍රදායික ද්‍රවිඩ පාලක පරපුරද නිහඬවම මුනිවත රැක ඇත්තේය. සැබැවින්ම ඔවුන් සහ වතු කම්කරුවන් අතර බොහෝ දුර පරතරයක් ඇත්තේය. එවන් අඳුරු සහ අභාග්‍ය සම්පන්න සමාජ වටපිටාවක් තුළ ඉතිහාසයේ ප්‍රථම වතාවට තේ ආර්ථිකයේ ජීවනාලිය වූ වතු කම්කරුවන් අතරින්ම සැබෑ ජනතා නියෝජිතවරියක් දේශයට දායාද වී ඇත්තේය. අම්බිකා නිසැක ලෙසම බඹර ප්‍රශ්නය පාර්ලිමේන්තුවට රැගෙන යනවා ඇත. රට පුරා බඹරුන් සමඟ සහෝදරත්වයෙන් සමීපව වැඩ කරන බිඟු සම්පත සුරැකීමේ සංවිධානයේ අපි ආගරපතන වැව්ලි සමාගමට පූර්ණ සහයෝගය දීමට ඉදිරිපත් වී සිටින්නෙමු. ප්‍රථමයෙන්ම බඹරුන් වනාහී කවුරුන්ද කියා සොයා බලමු.

## බඹරුන් වනාහි කවුරුන් ද ?




විද්‍යාත්මකව ඒපිස් ඩොර්සාටා (Apis Dorsata) යනුවෙන් වර්ගීකරණය කෙරෙන බඹරුන් ආදිවාසීන්ගේ භාෂාවෙන් කඳපල්ලි කියා ද ආසියාවට පමණක් ආවේණික හෙයින් ආසියාතික බඹරුන් ලෙස ද හැඳින්වේ. මව ප්‍රධාන කරගත් මාතෘ මූලික සමාජ සන්දර්භයක් සහිත බඹරුන් වාසස්ථාන ඉදි කිරීමේ දී ආලෝකය සහිත උස් ස්ථානයන් තෝරා ගන්නා අතර සුළඟේ වේගය අධික පළාත්වලදී බිම් මට්ටමට ආසන්න ස්ථානයන්හි කැදැල්ල ඉදි කර ගනිති. ඉතා ඉක්මනින් කෝපයට පත්වන අතර කුපිත වූ විට රාශි වශයෙන් පැමිණ පන්න පන්නා පහරදීමට පෙළඹෙති. උකුසු ප්‍රහාර, උණුසුම් සුළං දහරා සහ මිනිසුන්ගේ හිරිහැර කිරීම වැනි හේතූන් මත කුපිත වේ. පුෂ්ප පරාගනයේදී අති විශාල මෙහෙවරක් කරන අතර ශ්‍රී ලාංකීය භූමියේ පරිසර පද්ධතීන් සංරක්ෂණය සඳහා අත්‍යවශ්‍යම සත්ව විශේෂය බඹරුන් බව අප වටහා ගත යුතුය. වනාන්තර විනාශයත් සමඟ සිය නිජබිම අහිමි වී මායිම් ගම්මානවල අනාථයින් බවට පත් වූ බඹරුන් සිය අයිතිවාසිකම් වෙනුවෙන් ප්‍රධාන පරසතුරා වූ මිනිසුන් සමඟ බොහෝ අරගලවලට පෙළඹෙනු ඇත.

## බඹරුන්ගේ ආගමනය

බඹරුන්ගේ පැවැත්ම රැඳී පවතින්නේ සොබාදහමේ පැවැත්ම සහ එම රීතීන්ට අනුවය. අප හා අවට පරිසර පද්ධතීන් හා ආශ්‍රිතව පරිනාමය වූ සියලු ජීවීන්ගේ පැවැත්ම උදෙසා පුෂ්ප පරාගනයේ දී බඹරුන්ගෙන් සිදුවන අමිල මෙහෙවර අති විශිෂ්ටය. ඒ නිසාම බඹරුන්ගේ පැවැත්ම ද පුෂ්ප ශාක මත පමණක් රැඳී පවතී. ශ්‍රී ලංකාවේ පවතින දේශගුණික සාධක අනුව ශාකයන්හි පුෂ්ප ශාක හට ගන්නා කාල සීමාවන් ද එකිනෙකට වෙනස් වන අතර බඹරුන්ගේ සංචරණය ද ඒ අනුව තීරණය කෙරේ. දැනට බහුලව බඹර ප්‍රහාරයන් එල්ල වන ඉහළ සහ මධ්‍යම කඳුකරයෙහි කීන, බොර, මයික්‍රෝ, ඇල්බීසියා (සුදු මාර) මෙන්ම යුකැලිප්ටස් (රෙඩිගම්) ශාකයන්හි පුෂ්ප හට ගන්නා අප්‍රේල් සිට සැප්තැම්බර් සිට ඔක්තොම්බර් දක්වා කාල සීමාව බඹරුන්ගේ ව්‍යාප්ත කාලය බවට පත්වේ. මේ කාල සීමාවේ දී බඹර ගහණය සීමාව ඉක්මවා වර්ධනය වන අතර ප්‍රහාරයන් එල්ල වීම ද ඉහළ අගයක් කරා යනු ඇත.

### තේ වතු ආශ්‍රිතව බඹර ප්‍රහාරයන් වර්ධනය වන්නේ ඇයි ?

සමස්ත ශ්‍රී ලංකාවේම වන සතුන් සහ මිනිසුන් අතර නොනවතින අරගලයක් ආරම්භ වී ඇත. වන අලින්, දිවියන්, රිළවුන් සහ බඹරුන් අතර අරගලය ප්‍රධාන වන අතර ඊට හේතු සාධක ගණනාවක් ඇත. දැවැන්ත වන විනාශය, අසංවිධිත සංවර්ධන සැලසුම්, අක්‍රමවත් ජනාවාසකරණය, විදේශීය ශාක රෝපණය (විසිතුරු මල්) ප්‍රධාන හේතු සාධක ලෙස හඳුනාගෙන ඇත. 85% ක සාඩම්බර වන පෙතකට උරුමකම් කියූ ශ්‍රී ලංකාව වර්තමානය වන විට 15% ත් 20% අතර ඉතා දිලිඳු වන පද්ධතියක සිරකරුවන් වී ඇත. වන විනාශය නිසා පූර්ණ ජෛව විවිධත්වය බිඳ වැටෙමින් පවතින අතර පරිසර විනාශය නිසා ලැබෙන සමාවකින් තොර දඬුවම්වලට අපි සැම මුහුණ දෙමින් සිටින්නෙමු. කිසිදු සමාවකින් තොරව අපට ඒ දඬුවම් ලැබෙනවා ඇත. බඹර ප්‍රහාරයන්ද එම පරිසර විනාශයේම එක් බේදවාචකයක් පමණක්ම වන්නේය.

ශ්‍රී ලංකාවේ පරිසර හායනය ආරම්භ වන්නේ බ්‍රිතාන්‍ය ජාතිකයින් වතු වගාව ආරම්භ කිරීමත් සමගිනි. ගම්පොළ සිංහාපිටියෙන් ආරම්භ වූ කෝපි වගාව (1823) දිලීර රෝගයක් නිසා අසාර්ථක වූ විට පුස්සැල්ලාව රොත්ස්චයිල්ඩ් (Rothschild) වතුයායේ ශ්‍රී ලංකාවේ ප්‍රථම තේ වගාව ආරම්භ වී ඇති අතර පසු කලෙක ජේම්ස් ටෙලර් (James Taylor) තේ වගාව ව්‍යාපාරික පැත්තට රැගෙන ගියේය.

තේ වගාව සඳහා මධ්‍යම සහ ඉහළ කඳුකරයෙහි වන පද්ධතීන් සම්පූර්ණයෙන්ම වනසා දැමීමට සිදුවිය. සැබැවින්ම මේ නිරුවත් කර මරා දැමුණේ ශ්‍රී ලංකාවේ හරිත හදවත වන් ජල පෝෂක කලාපය වන අතර පෘථිවිය පරිනාමයේදී තම්බපන්නියට උරුම වූ ස්වාභාවික ජල ටැංකිය වනසා දැමීම ආරම්භ වූයේ එලෙසටය. හෙළ රජදරුවන්ගේ කාලයේදී සිංහලේ අවසාන මුරපොල කඩදොර සහ නව කඩදොර ගම්මානයන් ආශ්‍රිතව පිහිටා තිබිණ. ඉන් ඔබ්බට ඉහළ කඳුකරයට යන්නට අවසර ලැබුණේ ශ්‍රී පාද වන්දනාවට සහ රජයේ මැණික් නිධියක් තිබූ ස්ථානයකට පමණක් බව මනාව පැහැදිලි වේ. වසර තිහක් වැනි

කෙටි කාලයක් තුළ හෙක්ටයාර් ලක්ෂ ගණනාවක් කපා ගිනි තබා දැමූ විට බොහෝ පාරිසරික මෙන්ම ස්වභාවික උපද්‍රවයන් උපත ලැබුවේය. අහසින් වැටෙන වැස්ස සිය සිරුරට උරා ගනිමින් ලක්ෂ සංඛ්‍යාත ලොකු කුඩා උල්පත් මගින් රට වටා බෙදාහදා ගත් කඳුරට මිහිකත සුසුම්ලමින් අබිබගාත වූවෝය. මහවැලි, කැළණි, කළු, වලවේ ගංගාවෝ සරුසාර නොයිදුල් පස දුඹුරු පැහැති බොර දිය ලෙස මුහුද කරා රැගෙන යාම ආරම්භ කළෝය. කඳුකරය හෙළි කිරීම හා ඒ හා සමග ආරම්භ වූ සත්ව දඩයම් (Hunting) කලාව කලාපයට ආවේණික සත්ව කොට්ඨාශයන් වඳවීමේ යුගය කරා රැගෙන ගිය අතර අලි ඇතුන් සිය උපන් නිජබිම අතහැර වියළි කලාපයට සංක්‍රමණය වූවෝය. වියලි කලාපයේ අලි මිනිස් ගැටුම ආරම්භ වූයේ එලෙසටම ඉහළ කඳුකරයේ බොහෝ සත්ව කොට්ඨාශයන් මායිම් ගම්මානයන්හි අනාථ සත්ව කොට්ඨාශයන් බවට පත් වූයේ එසේය. සැබැවින්ම දිවියන් සහ බඹරුන් මායිම් ගම්මානයන්හි සදාකාලික අනාථයෝම වන්නේය. පාරම්පරික වාසස්ථාන අහිමි වූ මේ අහිංසකයෝ සිය දිවි ජීවන අරගය සඳහා නොසන්සුන් ජීවිත ගත කරන්නෝය. සිය උරුමය සහ අයිතිය වෙනුවෙන් සටන් වදින්නෝය. අවසානයේ දී සිය පරම සතුරා වූ මිනිසුන්ගෙන් සිය නිජබිමේ අයිතියත් රැකවරණයත් ඉල්ලා සිටින්නෝය. බිඟු සම්පත සුරැකීමේ සංවිධානයේ අපට මෙම දෙපාර්ශවයේම දුක සැප බෙදාගන්නට සිදුවී ඇත්තේය. මිනිසුන්ගෙන් බඹරුන්ද, බඹරුන්ගෙන් මිනිසුන්ද රැක ගැනීමට සිදු වී ඇත්තේය. එනිසාම ආගරපතන වැවිලි සමාගම සමග අත්වැල් බැඳ ගනිමින් හපුතලේ වතුයාය කේන්ද්‍ර ගත කර ගනිමින් අප යෝජනාවන් සහ ප්‍රායෝගික මෙහෙයුම ආරම්භ වී ඇත්තේය.

## ප්‍රවේශය

එහි ප්‍රථම පියවර වන්නේ තේ වතු ආශ්‍රිතව මී මැසි පාලන කටයුතු (Bee Keeping) ආරම්භ කිරීමය. වතු කම්කරුවන් මෙන්ම පාලනාධිකාරියද ප්‍රායෝගික මී මැසි පාලනයෙන් සන්නද්ධ කෙරෙන අතර ප්‍රායෝගික මී මැසි පාලනය හා අත්වැල් බැඳ ගනිමින් පූර්ණ මී මැසි පාලනයට ප්‍රවේශ වන පරිසර හිතකාමී මිනිසුන්ට බඹරුන් සමග සහයෝගයෙන් ජීවත්වීමේ කලාව දායාද කිරීම අප අරමුණ වේ. එම වැඩ පිළිවෙල ඔස්සේ බඹරුන් ගිනි තබා පුලුස්සා දැමීමට විරාමය තැබෙන අතර ජන ජීවිතවලට අභියෝගයක් ඇති ස්ථානයන්ගෙන් ඉවත් කර පරිසරයට මුදා හැරීම පමණක් සිදු වේ. සැබැවින්ම ශ්‍රී ලංකාවේ වසර දහස් ගණනාවක් පුරා බඹරුන් සහ දෙබරුන් ගිනි තබා වනසා දැමීම සිදු වී ඇති අතර වර්තමානයේදී බිඟු සම්පත සුරැකීමේ සංවිධානයේ මාර්ගෝපදේශකත්වය යටතේ එම අවාසනාවන්ත තත්වය පූර්ණ ලෙස වෙනස් කිරීමට භාජනය වී ඇත. එම තත්වයන් තුළ තේ වතු ආශ්‍රිතව බඹර ප්‍රහාරයන් අවම කර ගැනීම සඳහා

- තේ වතු පාලනාධිකාරිය
- වතු කම්කරුවන්
- අවට ගම්වාසීන්
- බිඟු සම්පත සුරැකීමේ සංවිධානය
- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
- කෘෂිකර්ම අමාත්‍යාංශය
- පරිසර සංවිධාන
- වන ජීවී අධිකාරිය
- පරිසර අමාත්‍යාංශය
- මධ්‍යම පරිසර අධිකාරිය
- ශ්‍රී ලංකා පොලීසිය
- ශ්‍රී ලංකා යුධ හමුදාව

මේ සියලු ආයතන හා අමාත්‍යාංශ අත්වැල් බැඳගත යුතු ඒ තීරණාත්මක මොහොත උදා වී ඇත.


## නව යෝජනා

1. තේ වතු ආශ්‍රිතව මී මැසි පාලන කටයුතු ආරම්භ කිරීම.
2. මී පැණි නිෂ්පාදනය සඳහා ගෝචර ශාක ලෙස වතු ආශ්‍රිතව හා මඟ දෙපස පලතුරු වගාව ආරම්භ කිරීම.

| | | |
|---|---|---|
| i. | අලිපේර | මී මැසි ගහනය වර්ධනය කිරීම තුළින් බඹර ගහනය තුනී කිරීම මෙන්ම ශ්‍රී ලංකාව මී පැණියෙන් ස්වයං පෝෂණය කිරීම සහ හපුතලේ බණ්ඩාරවෙල වැලිමඩ කලාපය අති සංවේදී පාරිසරික සංචාරක කලාපයක් බවට පරිවර්තනය කිරීම ධනාත්මක අපේක්ෂාවන් වේ. |
| ii. | වැලි අනෝදා | |
| iii. | කටු අනෝදා | |
| iv. | පේර විශේෂ | |
| v. | පැණි කාබරංගා | |
| vi. | උගුරැස්ස | |
| vii. | දෙහි - දොඩම් | |
| viii. | පැණි කාබරංගා | |
| ix. | සුදු සඳුන් | |

තේ වතු ආශ්‍රිතව ඉඩකඩ ඇති භූමි ප්‍රදේශයන්හි සහ මහ මඟ දෙපස යුරෝපියානු ශාකයන්ට විකල්ප ලෙස දේශීය පලතුරු සහ අත්‍යවශ්‍ය ඖෂධ මෙන්ම ආර්ථිකමය ශාක රෝපණය අපේක්ෂාව වේ. මෙම වගාවන් පරිසරය මෙන්ම ආර්ථිකයද හැඩ ගස්වනු ඇත. සමනලයින්, පක්ෂීන් මෙන්ම මී මැස්සන් ද වර්ධනය කරනු ඇත. මෙම හඳුන්වා දීම පයිනස් වගාවෙන් විරූපී වූ කඳුකරය වෙත නැවත ශ්‍රී ලාංකීය ජෛව විවිධත්වය රැගෙන යාම විය හැකිය. සැබැවින්ම පියවරෙන් පියවර දේශීය ශාකයන් කඳුකරය වෙත සංක්‍රමණය වන විට සියවස් ගණනාවක් පුරා අපට අහිමි කළ අපේ ජෛව විවිධත්වය අපේ, ශ්‍රී ලාංකීය ජෛව විවිධත්වය, සෙනෙහසින් සිය මාතෘ භූමිය වැළඳ ගන්නවා ඇත. අපට අහිමි කළ ජල පෝෂක කලාපය නැවත පුනරාගමනය වනු ඇත. අපි 2022 වසරේ අගෝස්තු මාසයේදී මධ්‍යම ආසියානු කසකස්ථාන දේශයේදී මේ අපූරු සංස්කෘතිය සැබැවින්ම දුටුවෙමු. කඳුකරයේද, උද්‍යානයන්හි මහ මඟ දෙපස ද අපට අත වනා සිනාසුනේ විවිධ වර්ණවත් පලතුරු මිත්‍රයෝමය. සැබැවින්ම මඟ දෙපස පලතුරු පොදු ජන වස්තූන්ම විය. ඉතා සරලව පවසන්නේ නම් මඟ දෙපස පලතුරු ඕනෑම කෙනෙකුට නිදහසේ රස බැලීමේ අයිතිය ඇත. අපි මේ සංස්කෘතිය හපුතලේ වතු යායෙන් රටට දායාද කරමු. එම පූර්වාදර්ශය රට පුරා සොඳුරු යථාර්තයක් වන විට පලතුරු ආනයනයට විරාමය තැබෙනු ඇත. ජාතික ධනය ඉතිරි වනු ඇත. දරුවන්ට පෝෂණය ලැබෙනවා ඇත. සොර සතුන්ගෙන් තොර ආදරණීය දේශයක් බවට පරිවර්තනය වනවා ඇත. අපි ඒ ස්වර්ණමය මඟ පෙන්වීම හා සොඳුරු තෝතැන්න හපුතලේ ප්‍රදේශයෙන් ආරම්භ කරමු. එකිනෙකට ආසන්නව ඇති හපුතලේ - බණ්ඩාරවෙල - ඇල්ල සංචාරක පාරාදීසයක් කරමු.

# හපුතලේ සංචාරක පාරාදීසය



හපුතලේ



බණ්ඩාරවෙල



ඇඩිසම් බංගලාව



හෝර්ටන්තැන්න



හපුතලේ තේ කර්මාන්ත ශාලාව





ලිප්ටන් සීට්



පියල් මාරසිංහ ඔසු උයන
හල්දුම්මුල්ල



ආරුක්කු නවය පාලම
ඇල්ල



රාවණා ඇල්ල



දුන්හිඳ ඇල්ල

ශ්‍රී ලංකාවේ මෙවන් ආකර්ෂණීය සංචාරක කලාපයක් වෙනත් නැති තරම්ය. එම ප්‍රවේශයන් සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රථම මී මැසි උද්‍යානය සුන්දර හපුතලේ නිර්මාණය කළ හැකිය. දෙස් විදෙස් සංචාරකයින් අතර යෝජිත බිගු උයන වඩ වඩාත් ජනප්‍රිය වනු ඇත.

මී මැසි රැජිණ බැහැ දැකීම, ගැහැනු මැස්සියන් සහ පිරිමි මැස්සන් හඳුනාගැනීම සිත් සේ මී මැස්සන් නැරඹීම, අතිනත හුවමාරු කර ගැනීම, මී පැණි නිෂ්පාදන රස බැලීම ශ්‍රී ලාංකීය සංචාරක ක්ෂේත්‍රයට ආකර්ෂණීය අත්දැකීමක් රැගෙන එනු ඇත. ප්‍රණීතවත් තේ පානය ශ්‍රී ලංකාවට වඩ වඩාත් ඩොලර් රැගෙන එනු ඇත. මේ ආර්ථිකයේ මහ පොළවේ නිර්මාණ ශිල්පීන් වන වතු කම්කරුවන් ගෞරවනීය මෙන්ම යහපත් ආදායම් ඇති ප්‍රාග්ධන හිමියන් බවට පත්වනු ඇත.

## බඹර බිය දුරු කරමු - තේ ලඳුන් රැක ගනිමු

ඉහත යෝජනාවන් සැබෑ යථාර්තයක් කරමින් බඹර උවදුර ශ්‍රී ලාංකීය ධන උල්පතක ප්‍රවේශය වනු ඇත. ඒ සඳහා

මී මැසි පාලනය ප්‍රායෝගික පුහුණුව

මී මැස්සන් පෙට්ටිගත කිරීම.

ජනපද බෝ කිරීම.

වැඩි දියුණු කිරීම.

පැණි අස්වනු නෙලා ගැනීම.

වතු ජනතාවට ප්‍රදානය වන අතර වඩාත් සාර්ථක මී මැසි පාලකයින් බඹරුන් සමඟ අරගලයට විරාමය තබනවා ඇත. ඒ දිනය ඉතා ඉක්මනින්ම උදාවනවා ඇත.

## මී මැසි උද්‍යානය - Bee Apiary

චීනයේ පැන්ඩාවුන් ද සිංගප්පූරුවේ කිඹුල් උද්‍යානයද ශ්‍රී ලංකාවේ අලි ඇතුන් ද තායිලන්තයේ මී මැසි උද්‍යානයන් ද මෙන්ම ශ්‍රී ලංකාවේ හපුතලේ ප්‍රථම බිඟු උද්‍යානය ලොව සුපතල පාරිසරික අත්දැකීමක් වනු ඇත.




.....................................

තුෂාර මහින්ද විජේසිංහ
ජාතික සංවිධායක,
බිඟු සම්පත සුරැකීමේ සංවිධානය.
077 6062 683

.....................................

තිස්ස බණ්ඩාර තඹවිට,
ලේකම්,
බිඟු සම්පත සුරැකීමේ සංවිධානය.
077 240 7217

.....................................

***Bee pera*** සංවිධානය,
කෘෂිකර්ම පීඨය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය.
071 656 9552